# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No – 10120

ෆැක්ස් / தொலைநகல / Fax – 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone – 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site – www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail – dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO – 196/2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No – / 2024

දිනය / திக / Date – 03/02/2024 පැය 2120

**මාධ්‍ය නිවේදනය**

## 01. මනුෂ්‍ය ඝාතනයක් - මතුගම පොලිස් වසම.

2024.02.03 වන දින අළුයම් කාලයේ මතුගම පොලිස් වසමේ සදසිරිගම, වැලිකැටිය ප්‍රදේශයේදී පුද්ගලයෙකු විසින් තවත් පුද්ගලයෙකුට තියුණු ආයුධයකින් පහරදීම හේතුවෙන් බරපතල තුවාල ලබා නාගොඩ රෝහලට ඇතුලත්ව ප්‍රතිකාර ලබමින් සිටියදී මියගොස් ඇති බවට මතුගම පොලිසියට ලද පණිවිඩයක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 33 ක් වන සදසිරිගම, වැලිකැටිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මරණකරු සැකකරුගේ ඥතිවරයෙකු වන අතර මත්පැන් පානය කරමින් සිටින අතරතුරදී ඇතිවූ බහින්බස් වීමක් දුර දිගයාම හේතුවෙන් තියුණු ආයුධයකින් පහරදී මෙම ඝාතනය සිදුකර ඇති බවට සිදුකළ විමර්ශනයේදී අනාවරණය වී ඇත.

ඝාතනය සිදුකල වයස අවුරුදු 27 ක් වන ඉහත ප්‍රදේශයේම පදිංචි සැකකරු අත්අංඩගුවට ගෙන ඇති අතර, මතුගම පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 02. පැහැරගෙන ගොස් තියුණු ආයුධ වලින් පහරදී තුවාල සිදු කිරීමක් - ඇඹිලිපිටිය පොලිස් වසම.

2024.02.02 වන දින උදෑසන කාලයේ ඇඹිලිපිටිය ඩිපෝව ආසන්නයේ දී වෑන් රථයකින් පැමිණි පුද්ගලයින් 05 දෙනෙකුගෙන් යුත් පිරිසක් විසින් මාර්ගයේ ගමන් කරමින් සිටි පුද්ගලයෙකු පැහැරගෙන ගොස් පහරදී තියුණු ආයුධ වලින් කපා තුවාල සිදු කිරීමක් සම්බන්ධව ඇඹිලිපිටිය පොලිසියට ලද පැමිණිල්ලක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**තුවාලකරු වයස අවුරුදු 22 ක් වන කිරලවැල්කටුව, ඇඹිලිපිටිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

පුද්ගලික ආරවුලක් හේතුවෙන් මෙම පැහැර ගැනීම සිදුකර ඇති බවට සිදුකළ විමර්ශනයේදී අනාවරණය වී ඇති අතර, තුවාලකරු ඇඹිලිපිටිය රෝහලේ නේවාසිකව ප්‍රතිකාර ලබමින් සිටියි.

පැහැර ගැනීම සම්බන්ධයෙන් තෝරගල, පදලංගල ප්‍රදේශයේ පදිංචි වයස අවුරුදු 34 ක් වන සැකකරුවෙකු අත්අංඩගුවට ගෙන ඇති අතර, අනෙක් සැකකරුවන් අත්අඩංගුවට ගැනීම සඳහා ඇඹිලිපිටිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**